**ශීර්ෂ 290 - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව පිළිබඳව විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂ 290 - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 දෙසැම්බර් 07 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම.**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

------------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

----------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 2,201.66 ක්වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 1,777.12 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 424.54 ක් හෙවත් සියයට 19.28 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 384.46 | 376.72 | 7.74 | 2.01 |
| මූලධන | 1,817.20 | 1,400.40 | 416.80 | 22.94 |
| **එකතුව** | **2,201.66** | **1,777.12** | **424.54** | **19.28** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුව වෙත ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් එකතුව රු. මිලියන 8.6 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 8.0 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 0.6 ක් හෙවත් සියයට 6.98 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේතයක් සඳහා රු. මිලියන 23 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු. මිලියන 22.8 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 99.1 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2015 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඌනතාවය | ඌනතාවය ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 10.03.07.06 | 23.00 | 22.78 | 0.22 | 0.96 |

## 2.3 අත්තිකාරම් ගිණුම

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 29001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 24.99 | 16.67 | 16.49 | 19.28 | 105.00 | 73.48 |

**2.4 පොදු තැන්පත්ගිණුම්**

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් හතරක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු. මිලියන 4.50 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0002/0096/000 | 0.25 |
| 6000/0000/00/0016/0047/000 | 1.17 |
| 6000/0000/00/0018/0055/000 | 0.05 |
| 6000/0000/00/0006/0073/000 | 3.03 |
| එකතුව | 4.50 |

**2.5 විගණන නිරීක්ෂණය**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ.**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන යාවත්කාලීන කර නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | වාහන ලැයිස්තුව | මුදල් රෙගුලාසි 1647 (ඉ) |
| (iii) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

## 3.2 විසර්ජන ගිණුම

### 3.2.1 අයවැය විචලනය

දියවර දිරිය ණය යෝජනා ක්‍රමය යටතේ පොලී සහනාධාර ගෙවීම සඳහා 290-1-1-3-1504 වැය විෂය යටතේ රු.මිලියන 42.0 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එයින් රු. මිලියන 2.7 ක් මුදල් රෙගුලාසි 66 මගින් වෙනත් වැය විෂයකට මාරු කිරීමෙන් පසු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 5.6 ක් හෙවත් සියයට 14.25 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

### 3.2.2 වෙනත් අමාත්‍යාංශ විසින් ලබාදුන් ප්‍රතිපාදන

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් ස්වයංරැකියා ප්‍රවර්ධන වැඩ සටහන් සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු ප්‍රතිපාදන උපයෝනය කිරිම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.

(අ) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ධීවර දිස්ත්‍රික්ක 15 ක් සඳහා පසු අස්වනු තාක්ෂණය හඳුන්වාදීම මගින් නාස්තිය අවම කිරීම සඳහා අවශ්‍ය දැනුම සහ උපකරණ ධීවර ප්‍රජාව වෙත ලබාදීම අරමුණු කරගෙන රු.මිලියන 8.26 ක ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත ලබා දි තිබුණි. නමුත් එම මුළු ප්‍රතිපාදනයම ගාල්ල දිස්ත්‍රික්කයේ නාකුළුගමුව ප්‍රදේශයේ ස්වයංරැකියා ප්‍රවර්ධන කටයුතු සඳහා පමණක් උපයෝජනය කර තිබුණි. නමුත් මේ අනුව පසු අස්වනු තාක්ෂණය හඳුන්වාදීම මගින් නාස්තිය අවම කිරීමේ අරමුණ ලඟාකර ගැනීමේ දී අවශ්‍ය දැනුම ලබාදීම අනිවාර්ය වුවද ඒ සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) ස්වයංරැකියා පුහුණු වැඩ සටහන් සඳහා රු.297,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, එම වැඩ සටහන් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රතිලාභීන් විසින් කිසිදු ප්‍රාග්ධනයක් යොදවා නොතිබු හෙයින් ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වීම සඳහා පසු විපරම් කිරීම සහ කාලීනව කාර්ය සාධනය ඇගයීම අනිවාර්යයෙන්ම සිදුකළ යුතු වුවත්, එම කාර්යය තොරතුරු කැඳවීමට පමණක් සීමා වී තිබුණි .

(ඇ) ස්වයංරැකියා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා රු.මිලියන 3.59 ක් වැය කර උම්බලකඩ පෝරණු 60 ක් සකස් කරදීම හා රු.මිලියන1.95 ක් වැය කර ලීටර් 500 ජල ටැංකි 440 ක් මිලදී ගෙන තිබුණි. එම උපකරණ මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14 මර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එම උපකරණ සමඟ ඇළුමිණියම් හට්ටි 360 ක් රු.මිලියන 2.40 ක් වැය කර මිලදී ගෙන තිබුණත්, එම ඇළුමිණියම් හට්ටි ප්‍රතිලාභීන් වෙත බෙදා දුන් බව තහවුරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.3 ආදායම් ගිණුම

ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් වෙත ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් 10.03.07.06 දරන ආදායම් සංකේතය යටතේ බලපත්‍ර ගාස්තු සඳහා ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්ය භාරය පැවැරි තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ආදායම සියයට 51 කින් වර්ධනය වී තිබුණි. අජීවී බෙල්ලන් කවච ප්‍රවාහන බලපත්‍ර ආදායමෙහි හා ස්වස්ථතා සහතික ආදායමෙහි පසුගිය වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් රු.1,678,250 ක් හෙවත් සියයට 26 කින් හා රු.2,196,800 කින් හෙවත් සියයට 41 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

(ආ) 2013, 2014 හා 2015 වර්ෂවල හිඟ ආදායම් පිළිබඳ හිස් වාර්තා ඉදිරිපත් කර තිබුණ ද, ධීවර යාත්‍රාංගන ලියාපදිංචි ආදායමෙහි පසුගිය වර්ෂයන්ට අදාළ හිඟ ගාස්තු ලෙස රු.45,000 ක් 2015 වර්ෂයේ ආදායමෙහි ඇතුළත් වී තිබීමෙන් හිඟ ආදායම නිවැරදිව ගණනය කර නොතිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

----------------------------------------------------------------------

විෂය අංක 29001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂයන්**

**---------------------------------------------------------------**

විශ්‍රාමික නිලධාරින් 04 දෙනෙකුගෙන් එකතුව රු. 410,203 ක මුදලක් හිඟහිටව පැවැතුණි. එම ණය ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 18ක් අතර කාලයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟ හිටි ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.1 හා 4.2 වගන්ති ප්‍රකාරව කටයුතු කර හිඟහිටි ණය ශේෂ අය කර ගැනිමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**(ආ) සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ**

**---------------------------------------------------------------**

සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු,අවුරුදු 01 සිට අවුරුදු 22 දක්වා පැරණි එකතුව රු. 419,534 ක් වූ ණය ශේෂ 12 ක් පියවා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

**(ඇ) වැඩ තහනම් කළ නිලධාරීන්ගේ ණය ශේෂ**

**--------------------------------------------------**

වැඩ තහනම් කළ නිලධාරින් 03 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 5 කට වඩා කාලයක සිට පැවැත එමින් තිබුණු රු.536,010 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු මුදලක් අය කිර ගැනිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**(ඈ) ඉල්ලා අස් වූ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ**

**--------------------------------------------------------------**

2015 දෙසැම්බර් 29 දින ඉල්ලා අස්වී ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.141,450 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.5.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2015 සංවර්ධන සැලැස්ම අනුව අමාත්‍යාංශ ප්‍රතිපාදන රු. මිලියන 99.3 ක් වැය කර ඉටු කිරීමට සැලසුම් කර තිබූ ධීවර හා ජලජ සම්පත් දෙපාර්මේන්තුවට අයත් සංවර්ධන කාර්යයන් 83 ක් දෙපාර්තමේන්තු ක්‍රියාකාරි සැලසුමට ඇතුළත් කර නොතිබුණි.

**3.5.2 අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන සැලැස්මේ ඇතුළත් විගණන කාර්යයන් 6 ක් අතරින් කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂයේදී ඉටුකර නොතිබුණි.

**3.5.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත තළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජුලි 28 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

වටිනාකම රු.1,085,000 ක් වූ මෝටර් වාහන 03 ක් වර්ෂ 2 ක කාලයක සිට නිෂ්ක්‍රියව පැවත එමින් තිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

2015 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතු වාහන පිළිබඳ සමීක්ෂණයක් සිදුකර අදාළ වාර්තා 2016 මැයි 06 දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

ආහාර හා කෘෂිකර්ම සංවිධානයට අයත් රු. 2,600,000 ක් වූ වාහනයක් 2015 වර්ෂයේ සිට විධිමත් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණි.

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු. 292,554,168 ක් විය. වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝනයන් කළ පසු ඉතිරිය රු.209,404 ක් වී තිබුණත්, එම ඉතිරිය ඉක්මවා රු.2,466,478 ක බැරකම්වලට එළඹ තිබුණි.

**3.7 අනුකූල නොවීම්**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීතිරීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 565(5) | මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශන ඊළඟ මාසය අවසන් වීමට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| 1997 පෙබරවාරි 03 දිනැති අංක 06/97 දරන චක්‍රලේඛයේ 02 ඡේදය | තනතුරක වැඩබැලීමේ උපරිම කාලය මාස 03 ක් වුවද, ජ්‍යෙෂ්ඨ ගුවන් විදුලි නිලධාරියෙකු 2010 දෙසැම්බර් 15 සිට සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) තනතුරේ රාජකාරි ආවරණය සඳහා ද 2011 අගෝස්තු 15 සිට 2015 අගෝස්තු 17 දක්වා රාජකාරි ඉටුකිරිම සඳහා ද, පත්කර තිබුණි. අවුරුදු 04 කට වැඩි කාලයක් සඳහා ස්ථිර නිලධාරියෙකු පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ | |
| 2015 ජුලි 10 දිනැති අංක 2/2015 දරන චක්‍රලේඛය | ගර්හිත බවට හඳුනාගත් වාහනයක අපහරණ කටයුතු අවසන් කර නොතිබුණි. අපහරණයට හඳුනාගත් වාහනවල ආරක්ෂාව තහවුරු කර නොතිබිම හේතුවෙන් එක් වාහනයක සුක්කානම් පෙට්ටිය අස්ථාන ගත වී තිබුණි. |

## 3.8 දේශීය මුල්‍යකරණය මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

----------------------------------------------------------------

### 3.8.1 ඉන්ධන මිල වැඩිවීම නිසා ධීවර කර්මාන්තයට වූ අහිතකර බලපෑම් අවම කිරීම සඳහා ධීවර යාත්‍රා හිමියන්ට ඉන්ධන සහනාධාර ලබා දීම.

------------------------------------------------------------------------------------------------

ඉන්ධන මිල වැඩිවීම හේතුවෙන් ධීවර කර්මාන්තයට ඇති වන අහිතකර බලපෑම අවම කිරීම සඳහා ධීවර යාත්‍රා හිමියන්ට වැඩි වූ ඉන්ධන මිල සහනාධාරයක් ලෙස ලබාදීමේ වැඩසටහනක් 2012 මාර්තු මාසයේ සිට ආරම්භ කර තිබුණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට පැවරී තිබූ අතර, ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව ඒ සඳහා සම්බන්ධ කරගෙන තිබුණි.

2013 සැප්තැම්බර් දක්වා ක්‍රියාත්මකව පැවති මෙම වැඩ සටහන වෙනුවෙන් ඉන්ධන කූපන්පත් මුද්‍රණය සඳහා රු. 5,501,420 ක් සහ සහනාධාර සඳහා චෙක්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මගින් රු. 4,549,775,000 ක් වශයෙන් එකතුව රු. .45,465,276,420 ක් මහා භාණ්ඩාගාරය මගින් වැය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ධීවර යාත්‍රා හිමියන් සඳහා තථ්‍ය වශයෙන් සපයන ලද ඉන්ධනවල වටිනාකම පමණක් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සංස්ථාව වෙත ප්‍රතිපූර්ණය කරනු වෙනුවට සංස්ථාව විසින් දෙපාර්තමේන්තුව වෙත භාරදුන් මුළු ඉන්ධන කූපන්පත්වල වටිනාකම වූ රු.මිලියන 4,549.77 ක් සංස්ථාවට ගෙවා තිබුණි. ඛණිජතෙල් නීතිගත සංස්ථාව වෙතින් ලබා ගන්නා ලද තොරතුරු අනුව එම සංස්ථාව විසින් ඉන්ධන සහනාධාර ලෙස ධීවර යාත්‍රා හිමියන්ට සපයා තිබූ ඉන්ධනවල වටිනාකම රු. මිලියන 4,373.68 ක් විය. ඒ අනුව රු.මිලියන 176.09 ක් ඛණිජතෙල් නීතිගත සංස්ථාවට වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) මෙම වැඩිපුර ගෙවීම තුළ දෙපාර්තමේන්තුව සතුව පවතින බවට තහවුරු කර ඇති කූපන්පත්වලට අදාළ වටිනාකම වූ රු.මිලියන 75.46 ද ඇතුළත් වී තිබුණි. ඒ අනුව එම වටිනාකම හෝ ගෙවීම වැළැක්වීමට හෝ දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. මෙහි අවසාන ගෙවීම භාණ්ඩාගාර බැඳුම්කරයක් මගින් 2014 පෙබරවාරි 10 දින ගෙවා තිබූ බැවින් ඒ පිළිබඳ භාණ්ඩාගාරය දැනුවත් කිරීමේ දෙපාර්තමේන්තු වගකීම නිසි පරිදි ඉටුකර නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාර බැඳුම්කරයක් මගින් ගෙවා ඇති රු.මිලියන 4,329.78 ක් වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් පොලී ගෙවනු ලබන බැවින්, වැඩිපුර ගෙවන ලද රු.මිලියන 176.09 ක් වෙනුවෙන් මහා භාණ්ඩාගාරය වාර්ෂිකව ගෙවනු ලබන පොලිය රජයට සිදුවන අලාභයක් වී තිබුණි.

(ඈ) ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව විසින් යාත්‍රා හිමියන්ට සපයන ලද ඉන්ධන වටිනාකම ලෙස සඳහන් රු. මිලියන 4,373.68 ක හි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුවේ ඉන්ධන කූපන්පත් පිළිබඳ තොග වාර්තාව අනුව ධීවරයන්ට නිකුත් කළ හැකිව තිබූ කූපන්පත්වල වටිනාකම රු.මිලියන 4,474.32 ක් වී තිබුණත්, රු.මිලියන 4,490.15 ක කූපන්පත් නිකුත් කළ බවට මහා භාණ්ඩාගාරයට දන්වා තිබුණි. ඒ අනුව රු.මිලියන 15.83 ක කූපන්පත් වැඩිපුර නිකුත් කර තිබුණි. මෙම වැඩිපුර නිකුත් කිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

### 3.8.2 ඉන්ධන සහනාධාර යෝජනා ක්‍රමයට විකල්ප ලෙස ධීවරයින්ට ධීවර උපකරණ ලබා දීම.

ඉන්ධන සහනාධාර ලබාදීමට විකල්ප ක්‍රමයක් ලෙස 2013 වර්ෂයේ ආරම්භ කර තිබූ ධීවර ප්‍රජාව සඳහා නවීන තාක්ෂණ උපකරණ හා තාක්ෂණ ආධාර ලබා දීමේ වැඩසටහන වෙනුවෙන් රු. මිලියන 3,390.12 ක් වැය කිරීමට සැලැසුම් කර තිබුණු අතර, එහි ක්‍රියාකාරීත්වයට අදාළව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේදී ආරම්භ කර තිබූ පිටත එංජිම සහිත යාත්‍රා වර්ග 2 කට හිමි ප්‍රතිලාභින් 14,811 ක් සඳහා ධීවර දැල්, GPS උපකරණ හා ජීවිතාරක්ෂණ කබා ලබා දීම 2015 දෙසැම්බර් 31 වන විටද අවසන් කර නොතිබුණි.

(ආ) එම යාත්‍රා හිමි ඉතිරි ප්‍රතිලාභීන් සඳහා ධීවර දැල් ලබාදීම 2015 වර්ෂයේ ආරම්භ කර තිබුණද, එම කාර්යය ඉලක්ක සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ) ඇතුළත එන්ජින් සහිත එක් දින යාත්‍රා හිමියන්ට ලබාදිය යුතු උපකරණ මිලදී ගැනීමට සැලැසුම් කර නොතිබුණි.

(ඈ) බහුදින ධීවර යාත්‍රා සඳහා VMS උපකරණ සවිකර දීමට 2015 වර්ෂයේ රු. මිලියන 605 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද, විගණිත දිනය වූ 2016 ජුලි 31 දින දක්වා එම කාර්යය ඉටුකිරීමට අපොහොසත්ව තිබුණි.

(ඉ) 2014, 2015 වර්ෂවල එකතුව රු.මිලියන 2,216 ක් වැයකර ධීවර නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා මෙකී ඉන්ධන සහනාධාර විකල්ප යෝජනා ක්‍රමය හඳුන්වා දී තිබුණ ද එය නිසි සැලසුමක් සහිතව කඩිනමින් ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත්ව තිබුණි. කෙසේ වුවද, 2015 වර්ෂයේ මුළු මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 14,860 කින් එනම්, සියයට 2.7 කින් පහත වැටී තිබුණ අතර, දළ දේශීය නිෂ්පාදනය සඳහා ධීවර අංශ දායකත්වය ද සියයට 1.5 සිට සියයට 1.3 දක්වා අඩු වී තිබුණි.

### 3.8.3 හම්බන්තොට ධීවර වරාය ඉදිකිරීම හේතුවෙන් අවතැන් වූ මාදැල් ධීවරයින්ට සහන සැලසීම.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හම්බන්තොට ධීවර වරාය ඉදිකිරීම හේතුවෙන් රැකියා අහිමි වූ මා දැල් ධීවර කාර්මිකයන් 7 දෙනෙකුට එක් දින ධීවර යාත්‍රාවක් බැගින් සහ අවශ්‍ය අනෙකුත් උපකරණ ලබා දීමට 2007 ඔක්තෝබර් 18 දිනැති අංක අමප/07/1656/351/029 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව 2008 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය අවසන් කළ යුතුව තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විට ධීවරයින් 6 දෙනෙකු සඳහා පමණක් යාත්‍රා සපයා තිබුණි. ඒ අනුව එකහ වූ පරිදි එක් ධීවරයෙකු වෙත යාත්‍රාවක් ලබාදී නොතිබූ අතර, ධීවරයින් 7 දෙනා සඳහාම ධීවර දැල් ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සැපයුම්කරු විසින් නිෂ්පාදනය කර භාරදීම පැහැර හරින ලද යාත්‍රාව වෙනුවෙන් ගෙවා තිබූ රු.773,000 ක මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් එය රජයට සිදුකළ අලාභයක් ලෙස නිරීක්ෂණය විය.

**3.9 කාර්යසාධනය**

-----------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව, ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යය සාධන වාර්තා අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්**

--------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් ඉලක්කගත කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

| **කාර්යය** | **වාර්ෂික ඉලක්කය** | **ඉටුකළ ප්‍රමාණය** | **ඉටුකිරීමේ ප්‍රතිශතය** |
|---|---|---|---|
| | **ඒකක** | **ඒකක** | |
| බහු දින යාත්‍රා සඳහා ලොග් වාර්තා ලබා ගැනීම | 40,000 | 16,073 | 40 |
| ධීවර යාත්‍රා රක්ෂණය කිරීම | 25,246 | 16,496 | 65 |
| ධීවර කාර්මිකයින් රක්ෂණය කිරීම | 64,621 | 28,496 | 44 |
| ධීවර හැඳුනුම්පත් නිකුත් කිරීම | 4,501 | 1,698 | 38 |
| මුහුදු යෝග්‍යතා සහතික නිකුත් කිරීම | 25,000 | 12,809 | 51 |

(ආ) දෙපාර්තමේන්තුව සිය ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් කාර්යයන් සඳහා මූල්‍ය හා භෞතික කාර්යසාධනය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

--------------------------------

සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) III තනතුර සඳහා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ගුවන් විදුලි නිලධාරියෙකු 2015 අගෝස්තු 17 සිට පත්කර තිබුණි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව තනතුර සඳහා ලිඛිත විභාගයක් පවත්වා අභ්‍යන්තර බඳවා ගැනීම් සිදුකළ යුතු විය. එසේ වුවද, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය පරිදි මෙම අවස්ථාවට පමණක් සීමාවනසේ ලිඛිත විභාගයකින් බැහැරව සම්මුඛ පරීක්ෂණයකින් පමණක් අදාළ තනතුර සඳහා බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ලබාදුන් අනුමැතිය මත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තිබුණි. එහිදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ජ්‍යෙෂ්ඨ ගුවන් විදුලි නිලධාරියාට තොරතුරු තාක්ෂණය පිළිබඳ පැය 360 ක පාඨමාලාවක් වෙනුවට පැය 120 ක පාඨමාලාවක් හදාරා තිබීම වෙනුවෙන් ලකුණු 05 ක් ද, ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා සහතිකයක් වෙනුවට පාඨමාලාවක් හදාරන ලද බවට ඉදිරිපත් කර තිබූ ලිපියක් සඳහා ලකුණු 05 ක් ද සාවද්‍ය ලෙස ලබා දී තිබුණි.

මෙම නිලධාරියා 1983 වර්ෂයේ කණිෂ්ඨ ගුවන් විදුලි නිලධාරි තනතුරට පත් කිරීමේ දී අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබූ අතර 1986 වර්ෂයේ එම තනතුරේ ස්ථිර කර ඒ සමගම ජ්‍යෙෂ්ඨ ගුවන් විදුලි නිලධාරි තනතුරට උසස් කර තිබුණි.

## 3.11 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

---------------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 48 | 28 | 20 | - |
| (ii) | තෘතියික මට්ටම | 21 | 11 | 10 | - |
| (iii) | ද්විතියික මට්ටම | 881 | 475 | 406 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 107 | 86 | 21 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 02 | - | 02 |
| | **එකතුව** | **1,057** | **602** | **457** | **02** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජ්‍යෙෂ්ඨ, තෘතියික හා ද්විතියික මට්ටම්වල අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 42 ඉක්මවූ පුරප්පාඩු ප්‍රමාණයක් පැවතී තිබුණි. දෙපාර්තමේන්තුව විසින් එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණු අතර, 2015 වර්ෂයේ වෙනුවෙන් පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුම අනුව සළසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණ ද, එම ඉතිරියන් කෙරෙහි කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවැතීම බලපා නොතිබුණි. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය අධිඇස්තමේන්තු කිරීමක් විගණනයේ දී නිරීක්ෂණය විය.